කොත්මලේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පරිගණක කට්ටල 03 ක හා ඡායා පිටපත් යන්ත්‍රයක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | වර්තමාන වෙළඳපොළ වටිනාකම තහවුරු කරගෙන ගිණුම්ගත කරමි. |
| (ii) | මෝටර් රථ හා කරත්ත උපලේඛනය තුළ ඇතුළත් කැබ් රථයක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම ලබාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අළුත්වැඩියාවෙන් පසු තක්සේරුවක් ලබාගෙන ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් තුළ සාවද්‍ය ලෙස බිල්කිරීම් හේතුවෙන් කපාහැරීම් ඉල්ලුම්කර ඇති රු.162,310 ක් ශේෂයන්ද ඇතුළත්ව තිබුණි. | සාවද්‍ය බිල්කිරීම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු පාලන ගිණුම්
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | --------------- | ---------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 03 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී රු.17,831 ක වෙනසක් විය. | ශේෂ සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම
---------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | --------------- | ---------------------- |
| (අ) | හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.72,285,221 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල හිමිකම තහවුරු කරගත නොහැකි විය. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කරමින් පවති. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------------

(i) ලැබිය යුතු ගිණුම්
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------- | ------------ | ------------------------ |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක් අයනොවී පැවතුණු ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.8,121,916 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකරගැනීමට කටයුතු කිරීම සහ සාවද්‍ය ශේෂ පවතින්නේ නම් සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක් ගතවී ඇති, ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.15,857,352 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | මධ්‍යම පරිසර අධිකාරිය පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර තිබියදී නීති විරෝධි ලෙස සභාව විසින් ගවඝාතකාගාරය පවත්වාගෙන යමින් පැවතුනි. | නීත්‍යානුකුල කිරීමට කටයුතු කළ යුතුවේ. | සෝගාතක ආඥා පනතේ නියමයන් අනුව වලංගු වෙළඳ බලපත්‍රයක් නිකුත් කර ඇත. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 104 | සභාවට අයත් ත්‍රී රෝද රථයක් අනතුරකට ලක්වී රු.34,440 ක අලුත්වැඩියා වියදමක් දරා තිබුණද ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරයේදී පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරමි. |
| (ඈ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව දේපළ තක්සේරුව සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | දැනට තක්සේරු කටයුතු ආරම්භ කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,359,070 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,290,001 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. කෙසේ වුවද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී නොසැසඳීම් පැවතිණි.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,229,000 | 4,404,781 | 3,217,500 | 1,187,281 | 4,142,000 | 4,468,779 | 4,038,161 | 2,144,546 |
| කුලී | 3,960,000 | 3,706,357 | 3,596,357 | 110,000 | 3,990,000 | 3,582,536 | 5,450,203 | 196,775 |
| බලපත්‍ර ගාස්තු | 9,304,000 | 3,317,119 | 3,317,119 | - | 6,940,000 | 5,523,998 | 5,523,998 | - |
| වෙනත් ආදායම් | 15,968,000 | 21,590,999 | 21,590,999 | - | 11,800,000 | 3,592,926 | 6,573,310 | 1,860,153 |
| | 33,461,000 | 33,019,256 | 31,721,975 | 1,297,281 | 26,872,000 | 17,168,239 | 21,585,672 | 2,201,474 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,015,988 ක උසාවි දඩ හා රු.8,679,890 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කොටසක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ). සභා බලප්‍රදේශය තුළ එකතුකරනු ලබන කසළ බැහැරකරන කොස්ගහපතන සහ හපුගස්තලාව කසළ බැහැර කරන ස්ථානවල විවෘත භූමියේ පොලිතීන් ඇතුළු මිශ්‍ර කසළ අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. | විධිමත් කසළ කළමණාකරන ක්‍රමවේදයක් සකස් කළ යුතු වේ. | නීත්‍යානුකූලව ඉඩමක් පවරා ගත් පසු විධිමත් කරමි. |
| (ආ). 2018 අගෝස්තු 09 දින වන විට ප්‍රාදේශීය සභාවේ නව දෙමහල් ගොඩනැගිල්ලේ පළමු අදියර ඉදිකිරීම් සඳහා රු.11,112,792 ක මුදලක් වැයකර තිබුණි. සභාව සතුව ප්‍රමාණවත් අරමුදල් පැවතියද එහි ඉතිරි වැඩ කොටසේ ඉදිකිරීම් 2019 අප්‍රේල් වන විටද ආරම්භකර නොතිබුණි. | ඉදිකිරීම් කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂවල සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |

3.2 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකිරීමට කටයුතු කරමි. |

3.3 කළමනාකරණ අකාරයක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රම්බොඩ දිය ඇල්ල නරඹන්නන්ට සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා 2017 ඔක්තෝබර් මාසයේ රු.55,000 ක් ගෙවා අපද්‍රව්‍ය බැහැර කරන ටැංකි 02 ක් මිලදීගෙන තිබුණද එම ටැංකි අදාළ ස්ථානයේ ස්ථාපනයකර නොතිබුණි. | ඉදිකිරීම් කඩිනමින් නිමකර ටැංකි ස්ථාපනය කළ යුතුවේ. | නව වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. ඉන් පසු ටැංකි ස්ථාපනය කිරිමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ රඳාගල්බඩ හා මීන් ජල යෝජනා ක්‍රම දෙකක් සඳහා 2017 වර්ෂයේදී පිළිවෙලින් රු.1,897,315 ක් හා රු.1,083,915 ක් වැයකර ජල නල මිළදී ගෙන තිබුණද අදාළ ජල යෝජනා ක්‍රම ආරම්භකර නොතිබුණි. | කඩිනමින් ව්‍යාපෘතිය නිම කිරිමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී ජල ටැංකියක් ඉදිකර ජලය ලබා දීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 වර්ෂයේ දී රු.859,070 ක වියදමක් දරා ඉදිකර තිබුණු තවලන්තැන්න පොදු වැසිකිළිය සඳහා ජල පහසුකම් ලබා දී නොතිබීම නිසා පරිහරණය කිරීමට නොහැකිව පැවතුණි. | හැකි ඉක්මනින් ජල සම්බන්ධතා ලබා දී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරමි.. |

3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 08 ක පුරප්පාඩු 32 ක් පැවතුනි. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | බඳවාගැනීම සඳහා අනුමැතියට ඉදිරිපත්කර ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිෂ්ක්‍රීය වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොත්මලේ නව නගරයේ දැනට වසර කිහිපයකට පෙර, සතිපොළ පැවැත්වීම සඳහා ඉදිකර තිබුණු ගොඩනැගිලි කිහිපයක් හා පොදු වැසිකිලිය කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව වල් බිහි වී නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය වැඩි දියුණුකිරීම් කර ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරි සංවර්ධන සිදු කර ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වටිනාකම ඉදිරිපත් නොකළ කැබ් රථයක් වසර 10කට අධික කාලයක් සහ රු.621,552 ක් වටිනා වාහන 02 ක් වසර 07 කට අධික කාලයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු පරිදි අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1. අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 193 අනුව පිලියෙල කළයුතු අයවැයගත සහ තත්‍ය ආදායම් වියදම් අතර විචලනයට හේතු පැහැදිලි කරන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව වෙනස්වීම් පිළිබව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී අයවැය පාලනයන් පවත්වාගෙන යමි. |